සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# සිංහල සාහිත්‍යය හා රසාස්වාදය

**11 ශ්‍රේණිය** **කාලය පැය 3 යි.**

නම/ විභාග අංකයඃ

- **I කොටසෙහි 01, 02 ප්‍රශ්න දෙකටත්, II කොටසෙහි 03 වෙනි ප්‍රශ්නයටත්, III කොටසෙන් තවත් ප්‍රශ්න දෙකකටත් වන සේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I - කොටස

01 අංක (i) - (v) තෙක් ඇති කොටස් කියවා ඒ එක එකක් පිළිබඳව අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ''සබඳ තොප විසින් කුමක් අසන ලද ද?''
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) ඉහත සඳහන් ප්‍රකාශයට ලැබුණු පිළිතුර කුමක් ද?

(ii) ''මල් නොහෙන පල දෙන
දිඹුල් තුරු සේ ඇම තැන
කිසි කරුණක් නොගෙන
දනන් සුවපත් කෙරෙති නිතියෙන''
(අ) මෙම කවිය ඇතුළත් වන ග්‍රන්ථය කුමක් ද?
(ආ) මෙහි දැක්වෙන උපමාව වෙන්කොට ලියන්න.

(iii) උණුසුම සිසිල සහ අතරෙහි ඇති ගුණය
ඇති අන් රටක් නැත මගෙ රට ඇති තැනය
මුව මී ගෝන ඇත් සේනා ඇති වනය
පවසන්නේය මට ඇති ජාතික ධනය
(අ) ඉහත පද්‍ය ඇතුළත් කවි පන්තිය රචනා කළේ කවරෙක් ද?
(ආ) අප රටේ ජාතික ගීතය ලෙස මේ කවියෙහි දැක්වෙන කරුණු අතරින් එක් කරුණක් ලියන්න.

(iv) මා දුප්පත් තැනැත්තියට සර්වසංහාරක නම් සුවඳ කොයින් ද?
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරු ද?
(ආ) සර්ව සංහාරක සුවඳ යනු කුමක් ද?

(v) මුහුදට ඇද්දෙන මහ ගංගා කුඹුරට යළි හරවා
ධාන්‍ය වගා කර සිරිලක මේ හෙළ බිම කෙත කරවා
(අ) මෙහි සඳහන් ගීත කාණ්ඩය අදාළ ගීතයේ මුල් පද පේළිය ලියන්න.
(ආ) මෙය කෙබඳු ගීතයක් දැයි දක්වන්න. (4 x 5 = 20)

02 පහත ගද්‍ය හා පද්‍ය කොටස්වල තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය පළමුව වෙන් වෙන්ව ලියා ඉන්පසුව එක් එක් පාඨයෙහි සමස්ත අර්ථය ලියන්න.

(i) ''අපි කැට මුගුරු ආදීන් මරන්න මෝ ද නවතාගත නුහුණුම් හ. නුඹ වහන්සේ විසින් ගිය දවසැ **වලින් ලද** පොකුණක් එවුව මැනව. ඒ පොකුණ හා අපගේ පොකුණ හා එක්කොට යොදා ගෙනෙම් හ.''

(ii) **සිතුමිණ** මෙන් ලොවට
සපැමිණි මෙ අප මුණිඳුට
**සුරසෙන් සිට** දෙපිට
සලති පැහැ විහිදි මිණි තල් වැට

(iii) ''අම්මොයි කී කෙනෙකුන් බස්
ඇසුවොත් **සවනතිනේ**
**වැව්වොයි** කඳුළැලි එ විගස
දෙනුවන් යුග හිතිනේ

(iv) නැවතත් රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් විමසනු පිණිස **රාජ මායමක්** කියන්නෝ, මොළොක් වූ හෝ දරුණු වූ හෝ යම්කිසි කාරණයකින් සත්ත්ව තෙමේ බැහැවට පැමිණ තමා සම්පතැ පිහිටා පසුව **ආචාර ධර්මයෙහි** හැසිරෙන්නේ යැ'යි කීහ.

(v) අවරට ගිය හිරු දෙව් තෙම
උණුසුම ගෙන දෙන **අටියෙන්**
සැඟවී සිටිය ද නො දනිමි
මොහුගෙ පාමුලේ (5 x 5 = 25)

## II - කොටස

- **පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

03 කෝංගහේ කොළ හැළුණා පිදුරු හොයන්නට සැමියා නැගගත් හැටියෙම පලේට
වැව උතුරා වාං දැම්මා දඬස්ගාල බිම වැටෙනව ඈ දැක්කා ඇගේ පවට
මහ රෑ වැව ඉස් මත්තෙන් ඇහැ ඇරලා බැලුවේ නෑ වතුර පොදක් නෑ බීවේ
උලමෙකුගේ හඬ ඇසුණා පුංචි පුතා තමයි ඇගේ දෙදරා ගිය හිත හැඳුවේ
මිනිසුන්ගේ හඬ ඇසෙනව පල්කඩවෙල පෝරු ගාන
නිකමට මෙන් ඇයට හිතෙයි ඉන්නේ යයි එයත් එතන

(1) මෙම කොටසෙහි සඳහන් සිව්වම්මා මුහුණපාන ඛේදවාචකය කුමක් ද? (ල. 05)

(2) මෙයට පසුබිම සකස් කරන කවියා ඒ සඳහා ගැමි පරිසරවල දැකිය හැකි විශ්වාසය ද උපයෝගී කර ගනී. මෙහි දී දක්නට ලැබෙන එවැනි විශ්වාසයක් නම් කරන්න. (ල. 05)

(3) අදාළ ඛේදවාචකය කවියා විකාශ කරන්නේ කෙසේ ද? (ල. 05)

(4) මේ පැදි පෙළ රසවත් වීමට භාෂා විලාසය බලපෑ ඇති අයුරු නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ල. 10)

<u>නැතහොත්</u>

පහත දැක්වෙන ගද්‍ය කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මා වෙල මැදින් අතුළු වන විට ම අම්මා මගට දුවගෙන ආවාය. අතේ තිබූ කෑම පාර්සලය ගන්ටත් පෙර අම්මා ඉතාම ප්‍රීතියෙන් ''දක්ක නේ ද පැංචෝ විදානෙයා වැට අහක් කරලා ඊයෙ රෑ උඹලගෙ අප්පච්චිවත් අඩගහල වැට සුද්ද කෙරෙව්වෙ. ඒ වුණත් වැට පැදුන එක කොච්චර එකක් ද? !'' මම කිසිවක් කථා නොකර ප්‍රීතියෙන් ගලා එන අම්මාගේ වචන මාලාවට තවත් කරුණු එකතු කරන්නට මෙසේ කීවෙමි.

''වැට පැදුණාටත් වඩා ලොකු එකක් තියෙනවා කියන්න. ඒක කියන්නයි අම්මේ මං ගෙදර ආවේ.''

''මොකක් ද පැන්චො කියාපියකො බලන්න. කච්චේරියේ පෙත්සමක් වත් විභාග කරන්න එන්න කියාලවත් ද?

''මම ජ්‍යෙෂ්ඨ පාස් වෙලා.''

''අනේ වාසනාවන් ! ජයසිරි මා හාමුදුරුවන්ට පිං සිද්ද වෙන්න මං ගල්ලෙන පන්සලට ගියොත් කියන්නේ උඹ ගැනම නේ ද? මගේ පැන්චාට දෙයියන්ගෙම පිහිටයි. තුණුරුවන්ගේම සරණයි.

''ඉතින් දැන් පැන්චට තවත් හොඳ රක්ෂාවක් ලැබෙයි ද?''

''ඒවා තවම නෑ අම්මේ.'' අම්මා සතුටු කඳුළු වැගිරෙව්වා ය. මීට අවුරුදු ගණනකට පෙර දිසාපති තුමා හමුවන්ට ගොස් අම්මාට ලොකු ආරච්චි සැරදාපු දවසේ ආ කඳුළු මට මතකයි.''

(1) මෙම ගද්‍ය කොටසෙහි ප්‍රධාන කරුණු කෙටියෙන් ලියන්න. (ල. 05)

(2) පහත සඳහන් යෙදුම්වල සැඟවුණු අදහස් පැහැදිලි කරන්න.
   (අ) දක්ක නේද පැන්චෝ විදානෙයා වැට අහක්කරලා
   (ආ) ඒ වුනත් වැට පැදුන එක කොච්චර එකක් ද?
   (ඉ) අනේ වාසනාවන් !
   (ඊ) අම්මා සතුටු කඳුළු වැගිරෙව්වාය. (ල. 05)

(3) මෙම මවගේ සිතට ලොකු සතුටක් ලබා දුන් කරුණු දෙකක් ගැන කියැවෙයි. ඒ කරුණු දෙක දක්වා එයින් පාඨකයාගේ සිත තුළ ඇතිවන චිත්ත රූප පැහැදිලි කරන්න. (ල. 05)

(4) රජරට ගැමි ජන ජීවිතයෙහි පැතිකඩක් මෙම ගද්‍ය කොටසින් නිරූපණය වන අයුරු නිදසුන් දෙකක්වත් ඇසුරෙන් විමසන්න. (ල. 10)

## III - කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් හිමි වේ.)**

04 උම්මග්ග ජාතකයෙහි ඇතුළත් වන සතරකන් මන්ත්‍රණය හා විවාහ යෝජනාව යන කතා පුවත් දෙකින් එක් කතා පුවතක් පමණක් ඇසුරු කොටගෙන කේවට්ට බමුණාගේ චරිතය උපහාසයට ලක්කරන අයුරු විමසන්න. (ල. 15)

05 කෝට්ටේ යුගයේ ලියැවුණු බුදුගුණ අලංකාරය භක්ති කාව්‍යයක් ලෙස වර්ග කරන්නේ කවර පදනමකින්දැයි නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 15)

06 ළමා හැසිරීම් සුන්දර ලෙස දකින කාව්‍ය නිර්මාණයක් ලෙස මීමන ප්‍රේමතිලක කවියාගේ ''පිටිසර ළමයෙක්'' කවි පංතිය අගය කළ හැකිය. නිදසුන් කවි දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 15)

07 ශ්‍රී ලංකා ධරණී තලයේ සොබා සිරිය මෙන් ම අතීත ශ්‍රී විභූතිය ''මගේ රට'' පද්‍ය පන්තිය ඔස්සේ පෙන්වා දී අයුරු නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 15)